# බෝංචි වගාව

ශ්‍රී බෝංචි ලෙගියුමිනොසේ (Leguminosae) කුලයට අයත් වන අතර, උද්භිද විද්‍යාත්මක නාමය පැසියෝලස් වුල්ගාරිස් (Paseolus vulgaris) නම් වේ. බෝංචි ශාකය ජනිත වී ඇත්තේ මධ්‍යම හා දකුණු ඇමෙරිකාවේය.

## ආහාර අගය

එළවළු අතර ප්‍රෝටීන් වැඩිම එළවළුවක් වන ශ්‍රී ලංකාවේ බෝංචි වඩාත්ම ජනප්‍රිය එළවළුවකි. එලෙසම වියළි බෝංචි ඇට ආහාරයට ගැනීම යුරෝපීය හා ලතින් ඇමෙරිකානු රටවල ඉතාම ජනප්‍රියයි. පහත වගුවේ බෝංචි කරල් ග්‍රෑම් 100 ක අඩංගු පෝෂණ අගය දැක්වේ.

*වගුව 1 බෝංචි කරල් ග්‍රෑම් 100 ක අඩංගු පෝෂක ප්‍රමාණය*

| සංඝටකය | ප්‍රමාණය | සංඝටකය | ප්‍රමාණය |
|---|---|---|---|
| ජලය | ග්‍රෑම් 88 | පොස්පරස් | මි.ග්‍රෑම් 48 |
| කැලරි | ග්‍රෑම් 36 | යකඩ | මි.ග්‍රෑම් 0.6 |
| ප්‍රෝටීන් | ග්‍රෑම් 2.5 | විටමින් ඒ | I U 750 |
| කාබෝහයිඩ්‍රේට් | ග්‍රෑම් 7 | විටමින් සී | I U 27 |
| මේදය | ග්‍රෑම් 0.2 | තන්තු | මි.ග්‍රෑ. 1.8 |
| කැල්සියම් | මි.ග්‍රෑම් 43 | | |

## ශාකයේ උද්භිද විද්‍යාත්මක ලක්ෂණ:

බෝංචි ප්‍රධාන ආකාර දෙකකි. එනම් පඳුරු ආකාරය හා වැල් ආකාරයයි. පඳුරු ආකාර බෝංචි ශාකය සෙ.මී. 30 - 45 පමණ උසට වැඩෙන අතර වැල් ආකාරය මීටර් 1.8-2.8 පමණ උස වෙයි. බෝංචි දින උදාසීන හෝ කෙටි දිනැති ශාකයකි. වැල් බෝංචි වල කඳ සර්පිලාකාරව ආධාරක වටා එතෙමින් වැඩෙයි.

මෘදු කඳන්වල ඒකාන්තර ත්‍රි පත්‍රි පත්‍ර දිග නටු සහිතව දැකිය හැකිය. පත්‍රිකා විශාල වන අතර, කෙඳි වලින් යුක්තයි. පුෂ්පය සුදු පැහැති හෝ දම් පැහැයට හුරුය. පුෂ්ප මංජරියකි. කඳේ ගැට අසලින් පුෂ්ප අංකුර හට ගනී. එක පුෂ්ප මංජරියක පුෂ්ප 4-8 දක්නට ලැබේ. පුෂ්පය පූර්ණ පුෂ්පයකි. මනිපත්‍ර පහක් ඇති අතර, ඒවා එකට බැඳුණු මනි පත්‍ර දෙකක් සේ ඇත.

**ආචාර්ය එච්.එම්. ආරියරත්න**
පර්යේෂණ නිලධාරී
ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ ආයතනය,
බණ්ඩාරවෙල.

පූර්ව පරාගන ආකාරය ස්වපරාගන වේ. කරල් දිග හා පටු සෘජු හෝ මඳක් නැමුණු රවුම් හෝ පැතලි ආදී වශයෙන් විවිධාකාර වේ. කරලේ පැහැය හා බීජ වල පැහැය විශාල පරාසයක ඇත. කොළ පැහැති හා කහ පැහැති කරල් ඇති ප්‍රභේද බහුලව දක්නට ලැබේ. මුල පද්ධතිය මුදුන් මුලකින් හා හොඳින් පැතිරුණු පාර්ශ්වික මුල් වලින් යුක්තයි. මුල ගැටිති දක්නට ඇති අතර, ඒවා මගින් නයිට්‍රජන් තිර කිරීම සිදු කරයි.

## දේශගුණය හා පරිසර අවශ්‍යතා:

බෝංචි උෂ්ණ කාළයට ගැලපෙන බෝගයක් වන අතර, ශීත, උප නිවර්තන හා නිවර්තන කලාපයේ රටවල වගා කරනු ලැබේ. සාමාන්‍යයෙන් නිවර්තන කළාපයේ රටවල අධික උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය නිසා රෝග හා කෘමි හානි ඉතා අධිකය. වගාව සඳහා වඩාත්ම සුදුසු උෂ්ණත්වය සෙ. අංශක 15 - 21 වන අතර, වගාව සෙ.අංශක 10-27 දක්වා වගා කල හැකියි. සෙ.අංශක 32 ට වඩා ඉහළ උෂ්ණත්වයේදී පරාගනය නිසි ලෙස සිදු නොවන අතර, එය මල් වැටීමට හේතු වේ.

වැඩි පාංශු කාණ්ඩ පරාසයක් තුළ බෝංචි වගා කළ හැකි අතර, වැලිමය ලෝම සිට මැටි පස දක්වා පසෙහි හොඳ ජල වහනයක් තිබේ නම් බෝංචි වගා කළ හැකිය. රතු, කහ ලොඩිසොලික් පස බෝංචි වගාව සඳහා ඉතාමත් සුදුසුයි. උචිත පී.එච්. අගය වනුයේ 6.0-7.5 දක්වාය. කාබනික ද්‍රව්‍ය වැඩි පසෙහි බෝංචි සරුවට වැඩේ.

ලංකාවේ බෝංචි වගා කරන දිස්ත්‍රික්ක අතර, බදුල්ල, නුවරඑළිය, රත්නපුර, නුවර හා මාතලේ ප්‍රධාන තැනක් ගනී. ලංකාවේ බෝංචි වගා වපසරියෙන් 30 - 40% වගා කරන්නේ බදුල්ල දිස්ත්‍රික්කයේය.

## වගා කරන ප්‍රභේද

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කරන ලද ප්‍රභේද කිහිපයකි.

*වැල් බෝංචි:*

**කෙන්තකි වොන්ඩර් ග්‍රීන්** කොළ පැහැති, දිග, කෙඳි සහිත අග නැමුණු පැතලි කරල් වලින් යුක්තයි. අස්වැන්න කඩන වාර ගණන 3-4 පමණ වේ. පුෂ්ප දම් පැහැතිය.

**කැප්පෙටිපොල තිල්:** බීජ කරල් කොළ පැහැතිය. රවුම්, දිග, කෙඳි ඇති කරල් සහිත ප්‍රභේදයකි. දින 60 කින් පමණ අස්වනු නෙලිය හැකිය. පුෂ්ප සුදු පැහැතිය. අස්වැන්න නෙළන වාර ගණන වැඩිය.

*පඳුරු බෝංචි ප්‍රභේද :*

**ටොප් ක්‍රොප්** බීජ දුඹුරු පැහැති වන අතර, ඉරි සහිතයි. කරල් ලා කොළ පැහැති, රවුම්, කෙඳි රහිත වන අතර, මධ්‍යම ප්‍රමාණයේ විශාලත්වයෙන් යුක්තයි. පුෂ්ප සුදු පැහැති වන අතර, දින 5 න් පමණ අස්වැන්න නෙලිය හැකිය.

**වේඩ්:** තද කොළ මාංශල කෙඳි රහිත කරල් ඇත. පුෂ්ප සුදු පැහැතිය.

**චෙරෝකි වැක්ස්:** පැතලි, ඔවලාකාර කෙඳි සහිත කරල් කහපාටට හුරුය. පුෂ්ප සුදු පැහැතිය.

## වගා කිරීම:

*බීජ අවශ්‍යතාවය:*

හෙක්ටයාරයක් සඳහා වැල් බෝංචි කි.ග්‍රෑ. 50 ක්ද, පඳුරු බෝංචි කි.ග්‍රෑ. 75 ක්ද, අවශ්‍ය වේ. ප්‍රභේදය අනුව බෝංචි බීජයේ ප්‍රමාණය හා බර වෙනස් වන හෙයින් බීජ අවශ්‍යතාවය වගා කරන ප්‍රභේදය අනුව තරමක් වෙනස් විය හැකිය.

පඳුරු බෝංචි සඳහා සෙ.මී. 40×10 පරතරයන්ද, වැල් බෝංචි සඳහා සෙ.මී. 50×40 පරතරයක්ද යොදා ගැනේ. පඳුරු බෝංචි සඳහා එක් ස්ථානයක පැල එකක්ද, වැල් බෝංචි සඳහා එක් ස්ථානයක පැල දෙකක්ද තිබීම නිර්දේශ කෙරේ. පඳුරු බෝංචි සඳහා කානු කැපීම මගින් ඇට සිටුවීම පහසු කර ගත හැකිය.

වැල් බෝංචි සඳහා පාත්තියක පළල වලවල් දෙකක් හෝ තුනක් යොදා ගැනීම සුදුසුයි.

වලවල් දෙකක් යොදා ගන්නේ නම් පාත්තියක පළල මීටර් 1 1/2 ක් වන අතර, දෙකක් යොදා ගන්නේ නම් එය මීටර් 1 ක් වේ. පඳුරු බෝංචි සඳහා මීටර 1 1/2 ක් පළල පාත්ති සුදුසුයි.

පොහොර යෙදීම: කාබනික පොහොර හෙක්ටයාරයකට ටොන් 10 ක් නිර්දේශ කෙරේ. මෙය එක් වළකට වැල් බෝංචි සඳහා ග්‍රෑ. 200 ක් වන අතර පඳුරු බෝංචි සඳහා ග්‍රෑ: 40 ක් වේ. කුකුල් පොහොර යොදා ගන්නේ නම් බීජ සිටුවීමට දින 5 ට පමණ පෙර පොහොර දමා ජල සම්පාදනය කර පස සමඟ කලවම් කළ යුතුයි. නොඑසේ නම් බීජ වලට හානි වී ප්‍රරෝහණය අඩු විය හැකිය. මූලික රසායනික පොහොර යෙදීම බීජ සිටුවීමට දින 1- 2 පමණ පෙර සිදුකල යුතුයි. බීජ සිටුවීමේදී ඒවා පොහොර වල ස්පර්ශ නොවීම වැදගත්ය.

මූලික රසායනික පොහොර ලෙස වැල් බෝංචි සඳහා හෙක්ටයාරයකට යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පේට් හා මියුරියේට් ඔෆ් පොටෑස් පිළිවෙලින් කි.ග්‍රෑ. 110, 275 හා 75 ක් මිශ්‍ර කොට යෙදිය යුතුයි. මතුපිට පොහොර යෙදීම සති 3 දී හෙක්ටයාරයකට යූරියා කි.ග්‍රෑ. 110 ක් හා මියුරියේට් ඔෆ් පොටෑස් කි.ග්‍රෑ. 75 ක් යෙදීම නිර්දේශිතයි.

පඳුරු බෝංචි සඳහා මූලික රසායනික පොහොර ලෙස හෙක්ටයාරයකට යූරියා කි.ග්‍රෑ. 85, ත්‍රිත්ව සුපර් පොස්පේට් කි.ග්‍රෑ. 165 ක් හා මියුරයේට් ඔෆ් පොටෑස් කි.ග්‍රෑ. 65 ක් යෙදිය යුතුයි. සති 2-3 දී මතුපිට පොහොර වශයෙන් හෙක්ටයාරයකට යූරියා කි.ග්‍රෑ. 85 ක් හා මියුරියේට් ඔෆ් පොටෑස් කි.ග්‍රෑ. 65 ක් යෙදිය යුතුයි. වල් මර්ධනය කර මතුපිට පොහොර යොදා බෝංචි පඳුරු වටා පස් දැමීම කළ යුතුයි.

## ආධාරක සිටුවීම:

වැල් බෝංචි සඳහා ආධාරක සිටුවීම අත්‍යාවශ්‍යයි. සති තුනේදී මතුපිට පොහොර යොදා පස් දැමීමෙන් පසුව අඩි 6 ක් පමණ උස කෝටු එක බෝංචි වලක් සඳහා එක කෝටුවක් බැගින් සිටුවිය යුතුයි. සමහර ගොවීහු වලවල් දෙකකට කෝටුවක් බැගින් සිටුවති. එය අස්වැන්න අඩුවීමට ප්‍රධාන හේතුවක් වේ. කෝටු සඳහා ඇපල, වල් සූරියකාන්ත, ග්ලිසිරිඩියා වැනි ශාක බොහෝ විට භාවිතා කරයි. ඇපල වැනි කෝටු දෙවතාවක් හෝ තුන්වතාවක් භාවිතා කළ හැකියි.

## ලණු මැසි ඇදීම:

කෝටු සිටුවා ඊට උඩින් කොහු ලණු මැස්සක් යෙදීම මගින් අස්වැන්න 20% පමණ වැඩිවන බැව් සොයා ගෙන ඇත. වඩා ශක්තිමත් ලී වටේට සිටුවා සෙ.මී. 50×40 කොටු ඇති වනසේ පොළොවේ සිට අඩි 6 ක් පමණ උසින් දෙපසට ලණු ඇදීම කළ යුතුයි. මෙම ලණු දිගේ බෝංචි වැලට තවදුරටත් වර්ධනය විය හැකිය. එමගින් පුෂ්ප ඇතිවන ස්ථාන ගණන වැඩිවන අතර, අස්වැන්න වැඩිවීමට එය බලපායි. මේ හැර දුර්වල කෝටු මගින් සිදුවන අවාසිය අඩුවීම, කෝටු කඩා නොවැටීම, සුළඟට ඔරොත්තුදීම, වල් මර්ධනය වීම හා කෝටු මත්තේ එක් රැහැණියට වැල් නොඑතෙන බැවින් රෝග හා පළිබෝධ අඩුවීමද සිදුවේ. මූලික වියදම මදක් වැඩිවුවත් භාවිතා කරන ලී හා ලණු 2 - 3 වතාවක් භාවිතා කළ හැකි බැවින් ඊළඟ කන්න වලදී වියදම අඩුවේ.

## 6. කෘමි පාලනය:

පහත සඳහන් කෘමින්ගෙන් වන හානිය වැදගත් කමක් ගනී.

**බෝංචි මැස්සා** *(Bean fly)*

gromyzidae කුළයට අයත්ය. සත්ව විද්‍යාත්මක නාමය Ophiomyia phaseoli වේ.

රෝග ලක්‍ෂණ ලෙස බීජ පැල මියයාම දක්නට ලැබේ. සුහුඹුලා ඉතා කුඩා කළු පැහැ මැස්සෙකි. ඌ කඳෙහි සිදුරු විද බිත්තර දමන අතර. එම බිත්තර වලින් ඇතිවන කීටයින් කඳ කා දමමින් ගමන් කරන අතර, එම හේතුව නිසා බීජ පැලය මිය යයි.

මර්ධනය සඳහා බීජ පැලයේ පළමු පත්‍ර දෙක ඇතිවන විට සංස්ථානික කෘමි නාශකයක් යෙදීම සුදුසුයි. මේ සඳහා මෙටසිස්ටොක්ස් හෝ ඩයිමිතෝඒට් යෙදිය හැකිය.

**කරල් විදින පණුවා** *(Podborer)*

කුළය Pyralidac වේ.
විද්‍යාත්මක නාමය Maruca testulalis) ය.

කරලේ සිදුරු දැකිය හැකිය. සුහුඹුලා අළු දුඹුරු පාටය. පුළු පියාපත් විශාල කොටසක් පාරදෘශ්‍යයි. බිත්තර පුෂ්ප අතර දමයි. කීටයා කරල් තුලට ඇතුල් වේ. ඌ කරල තුළ ඇති බීජ ආහාරයට ගනී.

මර්ධනය සඳහා පුෂ්ප පිපෙන අවධියේදී සුදුසු කෘමිනාශකයක් යෙදිය යුතුයි. ඇටබ්‍රොන්, ට්‍රෙබෝන් වැනි කෘමිනාශක නිර්දේශිතයි.

**රෝග පාලනය:**

ලංකාවේ දේශගුණ තත්ත්ව යටතේ වැදගත්වන රෝග කිහිපයකි.

**දුඹුරු පුල්ලි රෝගය:** *^Anthracn†e&*

මෙම රෝගය කොලට්‍රටිකම් ලින්ඩාමුතියානම් (Collectrotium Iindemuthionum) නම් දිලීරය මගින් වැළඳේ. මෙම දිලීරයද බෝංචි ශාකයේ සියලුම වායව කොටස් මත වැබේ. ප්‍රධාන වශයෙන්ම හානිය සිදුවන්නේ පත්‍ර වලටයි. පත්‍රයේ යටි පැත්තේ දුඹුරු මලකඩ පැහැති පුල්ලි ලෙස මෙම දිලීරය වර්ධනය වනු දැකිය හැකිය. මෙම ස්ථාන වලින් දුඹුරු පැහැති කුඩක් ලෙස දිලීර බීජානු පිටවනු දැකිය හැකිය. කරල් වලටද වැළඳිය හැකි මෙම රෝගය මුල් කාළයේ වැළඳුන හොත් බරපතල අස්වනු හානි සිදුවේ. මද උෂ්ණත්වය හා ඉහළ ආර්ධතාවය රෝගය පැතිරීමට හේතුවේ.

මර්ධනය සඳහා ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීම නිර්දේශිතයි. දුඹුරු පුල්ලි රෝගයට මෙන් පොලිකර් නම් දිලීර නාශක යෙදීමෙන් රෝගය මර්ධනය කළ හැකිය. වෙළඳ පොලේ ඇති වෙනත් දිලීර නාශකයද තරමක පාලනයක් සඳහා සුදුසුය.

**කෝණාකාර පුල්ලි රෝගය** *(Angular leaf spot)*

මෙම රෝග කාරකය පැසියෝසර්යෝප්සිස් ග්‍රීසියෝලා නම් දිලීරය වේ. ශාකයේ සියලුම වායව කොටස් වලට වැළඳිය හැකි නමුත් පත්‍රවල වැඩිපුර දක්නට ලැබේ. පත්‍රවල රෝග ලක්ෂණ පළමුව අලු දුඹුරු පැහැති පුල්ලි ලෙස ඇතිවේ. මේවා කෝණාකාර ස්වභාවයක් ගනී. මෙම රෝගය බීජ මගින්ද පැතිරිය හැකිවේ.

පාලනය සඳහා ප්‍රතිරෝධී ප්‍රභේද භාවිතා කිරීමත්, රෝග වලින් තොර බීජ තෝරා ගැනීමත් වැදගත් වේ. භෝග මාරුව ද නිර්දේශ කෙරේ. ඉහත දක්න ලද පොලිකර් නම් සංස්ථානික දිලීර නාශකයද මර්ධනය සඳහා යොදා ගත හැකිය.

**බෝංචි විචිත්‍ර වයිරස් රෝගය:**
*(Bean common m†aic virñ)*

මෙය වයිරස් මාගීයෙන් වැළඳෙන රෝගයකි. රෝග ලක්ෂණ අතර පත්‍රවල කළු පැහැති තිත් ඇතිවීම තද කොළ පැහැති විචිත්‍ර, පත්‍ර රෝල් වීම දැකිය හැකියි. ශාකයේ වර්ධනය ඇණ හිටීමක්ද දක්නට ලැබේ. මෙම

වයිරසයේ ප්‍රධාන වාහකයා වන්නේ කුඩිත්තාය. (Aphids)

පාලනය සඳහා ප්‍රතිරෝධී ප්‍රභේද භාවිතය නිර්දේශ කෙරේ. මේ හැර සුදුසු කෘමි නාශකයක් යොදා වාහකයන් මර්ධනය කිරීමද සුදුසුයි.

මෙම රෝගයන්ට අමතරව වෙනත් දිලීර, බැක්ටීරියා හා වෛයිරස් රෝග ඇතත්, ඒවා ශ්‍රී ලංකාවේදී එතරම් බරපතල නොවේ.

***අස්වනු නෙලීම හා පසු අස්වනු කටයුතු:***

පඳුරු බෝංචි දින 45 කින් පමණද, වැල් බෝංචි දින 60 කින පමණද, අස්වනු නෙලිය හැකිය. පරිභෝජනය සඳහා කරල් වේලීමට පෙර අස්වනු නෙලා ගැනීම වැදගත්ය. මනා පරිසර තත්ත්ව යටතේදී වැල් බෝංචි වලින් හෙක්ටයාරයකට ටොන් 10 - 15 ක හා පඳුරු බෝංචි වලින් ටොන් 05 - 10 ක අස්වැන්නක් ලබා ගත හැකිය.

අස්වනු නෙලීමෙන් පසු පාරිභෝගිකයා දක්වා යාමේදී පසු අස්වනු හානිය ලෙස බරින් 30% ක් අඩුවන බැව් වාර්තා වී ඇත. මෙය අඩු කිරීමට නම් සුදුසු ඇසුරුම් භාවිතා කිරීම ඉතා වැදගත්ය. මේ හැර මේරීමට පෙර අස්වනු නෙලීමද වැදගත්ය. ගොවීන් දැනට ඇසුරුම් වශයෙන් භාවිතා කරන ගෝනි හා දැල් මලු ක්‍රමයත්, ඒවායේ බෝංචි ඉතාමත් තදින් ඇසිරීමත් පසු අස්වනු හානිය වැඩිවීමට හේතුන් වේ. ප්ලාස්ටික් පෙට්ටි මගින් ප්‍රවාහනය ඉතා හොඳ ක්‍රමයක් වුවත්, එය ගොවීන් අතර තවමත් ජනප්‍රිය නැත.

***බෝංචි බීජ නිෂ්පාදනය:***

බෝංචි ස්වපරාගනය වන ශාකයක් බැවින් ගොවීන්ටම තමන්ගේ බීජ නිෂ්පාදනය කරගත හැකිය. බෝංචි බීජ නිෂ්පාදනය සඳහා කරන බෝංචි වගාවක වගා කිරීම් කටයුතු සාමාන්‍ය වගාවක් ලෙසටම පවත්වා ගෙන ගිය හැක. මෙහිදී එකම ප්‍රභේදයක් වගා කළ යුතු අතර, වෙනත් බෝංචි වගාවක සිට අවම මීටර 30 ක පමණ දුරක්වත් තිබිය යුතුය.

රෝගී ශාක තිබේ නම් ඉවත් කිරීම, වෙනත් ප්‍රභේදවල ශාක ඉවත් කිරීමත් අත්‍යාවශ්‍ය කරුණකි. රෝග හා කෘමි පාලනය මනාව පවත්වා ගත යුතුයි. පළමු අස්වැන්න පරිභෝජනය සඳහා කැඩීම මගින් බීජ අස්වැන්න වැඩිවන අතර, පසේ ගෑවීම නිසා රෝග තත්ත්වයන් ඇතිවිය හැකි කරල් ඉවත් කිරීමෙන් ලබා ගන්නා බීජවල නිරෝගී භාවය වැඩි කිරීමටද හේතු වේ.

අස්වනු නෙලන කාලයේදී වියළි කාළ ගුණයක් තිබීම අවශ්‍යයි. නැතහොත් බීජ කරල්වලදීම ප්‍රරෝහණය විය හැකි අතර, රෝගී තත්ත්වයන්ද ඇතිවේ. වියලුණු කරල් කඩා වියලා බීජ ඉවත් කර ගැනීම කළ යුතුයි. බීජ ඉවත් කිරීම වියලුණු බෝංචි කරල් පෑගීමෙන් කල හැකිය. ගෝනි වලට දමා පොලු වලින් තැලීමෙන් බීජ ඉවත් කර ගත හැකි වුවද, එයින් හානිවන බීජ ප්‍රමාණය වැඩිවේ. බීජ ලබාගත් පසුව නිසි ලෙස වියළා ගබඩා කළ හැකිය. තෙතමනය 11% අඩුවීම සුදුසුය. දිගු කලක් ගබඩා කරන්නේ නම් බීජ ගුල්ලාගෙන් හානිය වැලැක්වීමට සුදුසු කෘමිනාශක කුඩන් යෙදිය හැකිය. මේ සඳහා ඇක්ටලික් කුඩු නිර්දේශ කර ඇත. සාමාන්‍යයෙන් පඳුරු බෝංචි කි.ග්‍රෑ. 1 ක් සිටුවා බීජ කි.ග්‍රෑ. 10 ක් පමණද, වැල් බෝංචි කි.ග්‍රෑ. 1 ක් සිටුවා බීජ කි.ග්‍රෑ. 20 ක් පමණද අස්වැන්නක් ලබා ගත හැකිය.